# පළාත් පාලන ආයතන ඡන්දයෙන් පාඩම්

පසුගියදා පවත්වන ලද කොළඹ නාගරික සභාව ඇතුළු පළාත් පාලන ආයතන ගණනාවකට නියෝජිතයන් පත්කර ගැනීම සඳහා පවත්වන ලද මැතිවරණය මෙරට දේශපාලනයේ වත්මන් තත්ත්වය කුමක්දැයි කා හටත් දැනගැනීමට සැලස්වූ කැඩපතක් බඳු විය. පසුගිය ජනාධිපතිවරණයෙන් මාස හයකට පමණ පසුව ද ජනතාව තම දේශපාලන පක්ෂපාතීකම් සමස්තයක් වශයෙන් ගත් කල වෙනස්කරගෙන නැති බව පෙනී යයි. එමෙන්ම පැහැදිලි වූ තවත් කරුණක් වූයේ ඒ ඒ දේශපාලන පක්ෂ හා සංවිධාන වෙනුවෙන් කෙරෙන ප්‍රචාරවලින් එතරම් ප්‍රතිඵලයක් අත් නොවන බවය. කොළඹ නාගරික සභා මැතිවරණයෙන් අංක තුන දරන ස්වාධීන කණ්ඩායම ජයගත්තේ දැවැන්ත ප්‍රචාරක කටයුත්තක ප්‍රතිඵලයක් ලෙස නොවෙයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙහි කොළඹ පුරපති අපේක්ෂකයා වූ වාසුදේව නානායක්කාර මහතාට රජයේ ජනමාධ්‍යයෙන් වැඩිම ප්‍රචාරය ලබා දුනි. එහෙත් ඒ මහතා පරාජයට පත්විණි. බොහෝ දේශපාලන පක්ෂ මැතිවරණ ප්‍රචාරක කටයුතු කෙරෙහි සැලකිල්ලක් දැක්වුව ද මෙරට දේශපාලනයෙහි ඒ ප්‍රචාර එතරම් ඵලදායී නොවෙයි.

එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහතා මැතිවරණ ප්‍රචාරය සම්බන්ධයෙන් බටහිර ආයතනවලින් ද උපදෙස් ගන්නා බව අපි දනිමු. බටහිර ආයතනවලට මෙරට ජනයාගේ මනස තේරුම් ගැනීමට නොහැකිය. මෙරට දේශපාලනය තමන්ට රිසිලෙස හැඩගස්සවා ගැනීමට බටහිරයන්ට නොහැකි වී ඇත්තේ ද ඒ කරුණ නිසාය. බටහිරයන්ට දේශපාලන පක්ෂවල නායකයන් මෙහෙයවීමට හැකි වුවද තවමත් මෙරට ජනමනස තමන්ට අවශ්‍ය ආකාරයට මෙහෙයවීමේ හැකියාව නොමැත. කෙතරම් උපදෙස් ගත්ත ද රනිල් වික්‍රමසිංහ මහතා පරාජය වන්නේ ඔහු බටහිර ආයතනවලින් උපදෙස් ගන්නා නිසාම නොවේ. දේශපාලන ප්‍රචාරයට මැතිවරණවල දී එතරම් වැදගත් තැනක් හිමි නොවන බැවිනි.

පනස්හයේ මැතිවරණයේදී රූපවාහිනී හෝ පෞද්ගලික ගුවන් විදුලි නාලිකා නො තිබිණි. ලේක්හවුසියේ ජඩ දේශපාලනය අනුව එය එක්සත් ජාතික පක්ෂයේ හොරණෑව ලෙස ක්‍රියාත්මක විණි. එහි කතුවරු පසුව මොන වීරකම් පෑව ද බමුණුකුල බිඳවැටීම් ගැන ලීව ද මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ඔසවා තැබීමට කටයුතු කළහ. යම් පුද්ගලයකුගේ චරිතය මැනගත හැක්කේ ඒ පුද්ගලයා රැකියාවෙන් අස් වූ පසු හෝ විශ්‍රාම ගිය පසු හෝ කරන කියුම් කෙරුම්වලින් නොව ස්වයං රැකියාවක් නොවන රැකියාවක නිරත වී සිටියදී කරන කියන දෙයිනි. එකල ලංකාදීප පුවත්පත අද මෙන් නොව ස්වාධීන කතුවරුන් නිසා ස්වාධීන වූ පුවත්පතක් විය. ඒ පුවත්පත එක්සත් ජාතික පක්ෂයට ආවැඩීමට ඉදිරිපත් නොවීය. එහෙත් ප්‍රධාන පුවත්පත් වූයේ දිනමිණ හා සිළුමිණය. එසේ වුවත් එක්සත් ජාතික පක්ෂය මැතිවරණයෙන් අන්ත පරාජයක් ලැබීය. මෙරට ජනමතය කිසි දිනෙක තේරුම් ගැනීමට නොහැකි වූ මාක්ස්වාදියෝ (සම සමාජ පක්ෂය) හැටහතරේ ආණ්ඩුවේ කොටස්කරුවන් වීමෙන් පසුව ලේක්හවුසිය ජනසතු කිරීමට බණ්ඩාරනායක මැතිනියට බලකළහ. එහි ප්‍රතිඵලය වූයේ ආණ්ඩුව කඩා වැටීමය.

අද ඇතැම් ප්‍රධාන මුද්‍රිත හා විද්‍යුත් ජනමාධ්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට ආධාර කරන්නේ යැයි කීම බාග කියමනකි. ඒ ජනමාධ්‍ය හා වික්‍රමසිංහ මහතා අතර ඇත්තේ එයට වඩා දැඩි සම්බන්ධයකි. එහෙත් ඒ මහතා මැතිවරණවලින් පරාජයට පත්වෙයි. ආණ්ඩුවේ ජනමාධ්‍ය සාමාන්‍යයෙන් පළාත් පාලන මැතිවරණයේදී නොදකින මට්ටමකින් වාසුදේව නානායක්කාර මහතාට ආධාර කළේය. එහෙත් ඔහු පරාජය විය. මෙරට බොහෝ සිංහලයෝ බීබීසියේ අගුපිලෙන් ප්‍රචාරය කෙරෙන සංදේශයට සවන් දෙති. ඔවුහු එමගින් ලේ රත්කර ගනිති. ඒ ප්‍රචාරවලට නොරැවටෙති. මෙරට දේශපාලන මතය සකස් කිරීමේ දී ජනමාධ්‍යවලට පමණක් නොව ඊනියා ප්‍රචාරක රැස්වීම්වලට ද එතරම් වැදගත් තැනක් ලැබෙන්නේ යැයි සිතිය නො හැකිය. මෙරට ජනයා විශේෂයෙන්ම සිංහල බෞද්ධයෝ නෛසර්ගික දේශපාලන සත්ත්වයෝ වෙති. මිනිසා දේශපාලන සත්ත්වයෙකි. යන කියමන ග්‍රීසියේ නිර්මාණය වී ඇත්තේ ඉතා කෙටි කලක් තුළ එහි තිබූ ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයත් (බටහිර දේශපාලන විද්‍යාඥයන් අපට ඉගැන්වීමට තැත් කරන ආකාරයේ ඍජු අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයක් එහි නොතිබූ බව දැන් දැන් බටහිරයෝම කියති.) ග්‍රීකයන්ගේ වියුක්ත චින්තනයත් හේතුකොටගෙනය. එහෙත් මෙරට තිබූ ජනසම්මතවාදය හා බැඳුණු දේශපාලනයක් අපේ සංස්කෘතියෙහි අවුරුදු දෙදහසකට අධික කාලයක් තිස්සේ ගලා යයි. මෙරට දේශපාලනය අනෙක් දෑ මෙන්ම ජනතා පහන් සංවේගය සඳහා විය. සංකල්පය නොමැති වුවද සිංහලයෝ දේශපාලන සත්ත්වයෝ වූහ. ඒ සංස්කෘතියෙහි ජීවත්වන්නන්ට සර්වජන

ඡන්දයටවත් කේවල ක්‍රමයටවත් ඉන්පසුව ගෙන ආ සමානුපාතික නියෝජනයටවත් පුරුදුවීමට අමුතුවෙන් පංති අවශ්‍ය නොවීය.

එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලැබුණු විශාලම ජයග්‍රහණය වුයේ වාසුදේව නානායක්කාර මහතාගේ පරාජය ය. කොළඹ පරාජය වුයේ වාසුදේව චින්තනය ය. ජනතාව මහින්ද චින්තනය ජයග්‍රහණය කර ඇත්තේ වාසුදේව චින්තනය පරාජය කරමින්ය. මහින්ද චින්තනය ඒකීය හෙවත් එක්සේසත් ය. වාසුදේව චින්තනය සන්ධීය හෙවත් පෙඩරල්ය. මහින්ද රාජපක්ෂ මහතා සන්ධානයේ පුරපති අපේක්ෂකයා ලෙස වාසුදේව නානායක්කාර මහතා පත් කළේ ඔහු පරාජයවන බව දැනසිටි නිසා දැයි නො දනිමි. කෙසේ වෙතත් ඊළම වෙනුවෙන් කොටි සංවිධානයට පක්ෂපාතීව පිටරට පැවැත්වූ පෙළපාලිවල ගමන්කර ඇති වාසුදේව නානායක්කාර මහතාට සිංහලයන්ගේ මනාපයක් නැත. මෙරට ජඩමාධ්‍යවල ලියන්නේ බොහෝ දෙනකු ඊනියා ප්‍රබුද්ධයන් වීම නිසා අපට ජඩමාධ්‍යයෙන් නිතර අසන්නට, කියවන්නට, දකින්නට ලැබෙන්නේ දෙමළ ජාතිවාදයට පක්ෂපාතී මතවාදය. ඊනියා ප්‍රබුද්ධයන් වීමට පෙරුම් නොපුරණ නිසග දේශපාලන සත්ත්වයන් වූ සිංහලයන් ඒ මතවාද ප්‍රතික්ෂේප කරන්නේ කෙසේ දැයි ඉගෙන ගන්නේ මවු කුසෙහිදීමය. (මේ බව මා දන්නේ කෙසේ දැයි පඬියකුට ප්‍රශ්නයක් නම් ඒ පෞද්ගලිකව තේරුම් කර දිය හැකිය.) මේ ජනමාධ්‍ය දෙමළ ජාතිවාදී මත මෙතරම් ප්‍රචාරය කරද්දීත් සිංහලයෝ සන්ධීය (ෆෙඩරල්) ක්‍රමයකට අකමැති වෙති. ජඩමාධ්‍යයට අනුව සිංහලයෝ සංධීය ක්‍රමයකට කැමැති වෙති. එහෙත් ජනමතය ප්‍රකාශ වන්නේ එයට විරුද්ධවය. මේ මෙරට කසිකබල් ප්‍රබුද්ධයන්ගේ සදාතනික ෙ€දවාචකය ය.

යම්කිසි අයුරකින් වාසුදේව නානායක්කාර මහතා ජයගත්තේ නම් පඬියන් ඒ අර්ථ දක්වනු ඇත්තේ සංධීය රාජ්‍යයේ ජයග්‍රහණයක් ලෙසය. එතැනින් නො නැවතෙන ඔවුන් සංධීය රාජ්‍යයක් පිහිටුවීම සඳහා මහින්ද රාජපක්ෂ මහතාට බලකරනු ඇත. එවැනි ක්‍රියාවලට දැන් ඉඩක් නැත. එක්සත් ජාතික පක්ෂය නිල වශයෙන් තරග නොකරද්දීත්, එක්සත් ජාතික පක්ෂයේ ඇතැමුන් සිරිසේන කුරේ විරෝධය හෝ වෙනත් හේතුවක් නිසා වාසුදේව නානායක්කාර මහතාට රහසින් සහාය දෙද්දීත් ඒ මහතා පරාජය විය. ඒ මහතාගේ ප්‍රතිපත්ති කවරක් වුවද දෙමළ, මුස්ලිම් ජනයා තොග පිටින් පැමිණ ඔහුට ඡන්දය නො දුන්හ. මේ ජනකොටස්වල ඡන්ද බහුතරයක් කිසිම සිංහල අපේක්ෂකයකුට නො ලැබෙන බව පැහැදිලිය. වාසුදේව චින්තනයේ දෙමළ ජාතිවාදී ප්‍රතිපත්තියට දෙමළ ජනයාගේ ඡන්ද ලැබේ යැයි යමකු සිතුවේ නම් ඒ මුළාවකි. සිංහලයන් ඡන්දය දීමේ දී අපේක්ෂකයාගේ ජාතිය ජන වර්ගය නො සැලකුවද, දෙමළ මුස්ලිම් ජනයා සම්බන්ධයෙන් ඒ බව කිව නො හැකිය. සිංහලයන්ගේ ඡන්දය බොරැල්ලේදී හා වෙනත් පෙදෙස්වලදී මොහොමඩ්ලාට ලැබුණ ද මුස්ලිම් හා දෙමළ ජනයාගේ ඡන්ද එසේ වාසුදේවටවත්, වික්‍රමබාහුටවත්, සිරිතුංගටවත්, ඔවුන් කෙතරම් දෙමළ ජාතිවාදී වුවත්. නො ලැබෙයි. ගමේ මෙන් නොව කොළඹ ඇත්තේ බූලත්කොළ නොව ත්‍රිරෝද රථ යැයි වික්‍රමබාහු මහතා ප්‍රකාශ කර තිබිණි. එහෙත් මිනිසුන් ත්‍රිරෝද රථවල ගමන්කර ඇත්තේ ඇස් කණ්නාඩි පැළඳගෙනය. ඇස් කණ්නාඩියේ ජයග්‍රහණය ගැන මගේ සතුටක් නැත. එහෙත් වාසුදේව චින්තනය පරාජයවීම ගැන මම සතුටු වෙමි. වික්‍රමබාහුගේ පරාජය කතා කළ යුත්තක් වත් නොවේ. මෙරට මාක්ස්වාදී දේශපාලනය මියගොස්ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙරට ජාතිකත්වයේ පක්ෂය බවට සිංහලයන් අතර පිළිගැනීමට ලක්වීමත් සමඟ අප දකින්නේ මාක්ස්වාදයෙහි ක්‍රමික අභාවයය. වික්‍රමබාහුලා පමණක් නොව තිස්ස විතාරණලා ද, ඩිව් ගුණසේකරලා ද දේශපාලන වශයෙන් මළගිය ඇත්තෝ වෙති. මළවුන්ගේ අවුරුදු දා අප දකින්නේ ඔවුන්ගේ හොල්මන් පමණය. වාසුදේව නානායක්කාර මහතා පුරපති අපේක්ෂකවීම නිසා ඔවුන් යළි උපන්නේ යැයි සිතුවකුට වුව ද කියවීමට ඇත්තේ ගන්ධබ්බ අපදානයකි.

ජ. වි. පෙරමුණට ද ඉගෙන ගැනීමට පාඩම් ඇත. ගම්පහ සන්ධානය තරගයෙන් ඉවත්කෙරී සිටියදීත් ජ. වි. පෙරමුණට සැලකිය යුතු ඡන්ද සංඛ්‍යාවක් නො ලැබිණි. ජ. වි. පෙරමුණේ ද ඇත්තේ පනස්හයේ දරුවන් වුවද, තවමත් ජනතාව අතර සිටින පනස්හයේ දරුවන්ගේ අතිමහත් බහුතරය ජාතිකත්වයේ පක්ෂය ලෙස සලකන්නේ ශ්‍රී. ල. නි. පක්ෂය ය. එයට හෝ ඒ ප්‍රමුඛ සන්ධානයකට හෝ නොදෙන ඡන්දයක් වෙනත් පක්ෂයකට දීමට සිංහලයන්ගෙන් අතිමහත් බහුතරය සූදානම් නැත. ජ. වි. පෙරමුණ ජාතිකත්වයේ පක්ෂයක් වීමට නම් මුළුමනින්ම මාක්ස්වාදී හැව ඇරිය යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva